# දම්පාට මලෙන් කොළ පාට ගෙඩියක්



එච් එම් වගීෂ ප්‍රභාෂ්වර බණ්ඩාර

# දම්පාට මලෙන් කොළ පාට ගෙඩියක්

එච් එම් වගීෂ ප්‍රභාෂ්වර බණ්ඩාර

කතෘ

පළමු දිගහැරුම

මහ/ශාන්ත සිල්වෙස්තර විදුහල

3 ශ්‍රේණිය

**2025.02.08**

**ISBN - 978-624-208-714-6**

# පිදුම

මෙම පොත ලියා අවසන් කිරීමට පුංචි මට උදව් උපකාර කල

මහ/රණබිම රාජකීය විදුහලේ

එන් ඩී සී එස් ගුණතිලක ගුරු මැණියන්ට පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමය අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛබ සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛණ කරණයට යොමුවීම ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහමායා බාලිකා විද්‍යාලය- මහනුවර.

# පටුන


- හැඳින්වීම
- ක්‍රමය
- නිරීක්ෂණ
- නිගමන
- අත්දැකීම් හා ලබාගත් දැනුම
- ගැටලු හා විසඳුම්
- පරිසර අධ්‍යයනයෙන් මගේ අනාගත සැලසුම්
- පරිසරය සුරැකීමට මගේ දායකත්වය

## හැදින්වීම

මගේ ගෙදර තිබෙන පැෂන් වැලේ ලස්සන මල් හැදෙනවා

රතුපාට කොළ පාට ගෙඩි හැදෙනවා. ඒ මල් ගෙඩි හැදෙන විදිහ මට ඉගෙන ගන්න සිතුනා.

ක්‍රමය

වැල් දොඩම් මල වෙනස් වෙන විදිහ මාසයක් බැලීම

යොදාගත් උපකරණ

අත්කාචය

තොරතුරු සොයාගත් හැටි

අම්මාගෙන්


ගුරුවරුන්ගෙන්

මාමාගෙන්

අන්තර්ජාලයෙන්

## පැෂන් මලෙන් ගෙඩි එන විදිහ

| | | | |
|---|---|---|---|
| **දිනය** | **2023.07.26** | **ස්ථානය** | **ගෙවත්ත** |
| **කාලය** | **1100 දවල්** | **කාලගුණය** | **ඉර පායා ඇත** |




**දවසක් නැන්දිලා, අපේ ගෙදර ආවා. එයාලට අම්මා රස බීමක් හදලා දුන්නා. ඒ බීම තමයි පැෂන් බීම.**

**මගේ ගෙදරත් පැෂන් වැලක් තියෙනවා.ඒකෙ ඉර මාමා වගේ ලස්සන මල් තියෙනවා. රසම රස පැෂන්  ගෙඩි හැදෙන්නේ මලකින් කියලා අම්මා කිවුවා.**


**පැෂන් කියන්නේ වැලක් ගසක් නෙමෙයි. ඒකේ කොළ මල් පොහොට්ටු පොඩි ගෙඩි ලොකු ගෙඩි මල් දැක්කා.**

**මල්වල මී මැස්සෝ පැණි බොන්න ඇවිත් හිටියා.**

**පැෂන් මලකින් ගෙඩියක් එන විදිහ සොයන්න මට හිතුනා.**

## මගේ පැෂන් වැල

| | | | |
|---|---|---|---|
| දිනය | 2023.07.26 | ස්ථානය | ගෙවත්ත |
| කාලය | 1100 දවල් | කාලගුණය | උණුසුම් දිනක් |





අද මම පැෂන් වැල ළඟට ගියා. හරි ලස්සන පැෂන් මල් තියෙනවා. උදේ 10.00 ඉඳන් මම පැෂන් පොහොට්ටුව දිහා සැරින් සැරේ බැලුවා. ටික ටික පැෂන් මල් පිපුණා. දවල් 12 30 වෙනකොට මල දිග ඇරිලා පිපුණා. ඒ මල හරිම ලස්සනයි.

දැන් වෙලාව හවස දෙකයි.මම පැෂන් මල ඇල්ලුවා. යට තිබුණු පෙති ඝනකමයි. උඩ පෙති සිනිඳුයි.අනික් මල්වල හිටිය මී මැස්සෝ පියාඹලා ගියා.

ලස්සන මල පරවෙලා

| | | | |
|---|---|---|---|
| දිනය | 2023.07.26 | ස්ථානය | ගෙවත්ත |
| කාලය | 1100 දවල් | කාලගුණය | ඉර පායා ඇත |




අද මම මල බලන්න ගියා. ලස්සන මල පර වෙලා. මට හරිම දුකයි.

මලේ තිබුණු පෙති සියල්ලම එකට එකතු වෙලා.

මලේ වහලා හිටිය මී මැස්සො කවුරුත් අද නැහැ.

අම්මා කිවුවා මල පරාගනය වෙලා කියලා. පරාගනය කියන්නේ මොකක්ද කියලා මම දන්නේ නෑ ලොකු උනහම මම ඒ ගැනත් සොයනවා.

මම පැෂන් මල ගැන කවියක් හැදුවා.

ඉර මාමා පායනවා
පැෂන් මලක් හිනැහෙනවා
මී මැස්සෝ පැණි බොනවා
පුංචි මමත් හිනැහෙනවා

## පුංචි ගෙඩියක් ඇවිත්

| | | | |
|---|---|---|---|
| දිනය | 2023.07.26 | ස්ථානය | ගෙවත්ත |
| කාලය | 1100 දවල් | කාලගුණය | සාමාන්‍ය |




මම මල බලන්න ගියා

මල දුඹුරු පාට වෙලා

වේලුණු මල ඇතුලෙන් මම පුංචි ගෙඩියක් දැක්කා. අද මට හරි සතුටු දවසක් ඒ ගෙඩියේ යට සුදු පාටයි. උඩ තද කොළ පාටයි. සුදු පාට තිත් ගොඩාක් තිබුණා. මම අත්කාචයකින් පැෂන් ගෙඩිය බැලුවා. ඒකෙ සුදු පාට තිත් එකතු වෙලා ඉරි තිබුණා.

පැෂන් ගෙඩියේ හිලක්

| | | | |
|---|---|---|---|
| දිනය | 2023.07.26 | ස්ථානය | ගෙවත්ත |
| කාලය | 1100 දවල් | කාලගුණය | සාමාන්‍ය |




මම පැෂන් ගෙඩිය බලන්න ගියා. පැෂන් ගෙඩියේ දුඹුරු පාට පුංචි හිලක් තිබුණා. මම ඒක අත් කාචයකින් බැලුවා. ඒ පුංචි හිල ඇතුළටම ගිහිල්ලා.

මම ඒක අම්මට පෙන්නුවා. අම්මා කිවුවා ඒ මැස්සෙක් විදලා කියලා

මම පැෂන් වැල සෙලෙව්වා.

දිග තටු තියෙන තැඹිලි පාට මැස්සෝ දෙන්නෙක් ඉගිල්ලිලා ගියා.මගේ පැෂන් ගෙඩියේ හිලක් හැදුවේ.

එයාලද දන්නේ නෑ. පැෂන් ගෙඩියේ හිලක් හදපු තැන මම අල්ලලා බැලුවා. එතන හරිම හයියයි.

දිනය 2023.07.26 ස්ථානය ගෙවත්ත

කාලය 1100 දවල් කාලගුණය උණුසුම්



අද මගේ පැෂන් ගෙඩියේ තවත් තැනකට මැස්සෝ විදලා. මට හරිම දුකයි. මැස්සෝ විදපු තැන් වටේම දුඹුරු පාට වෙලා. ඒ තැන් ගොඩාක් හයියයි.

දිනය 2023.07.26 ස්ථානය ගෙවත්ත

කාලය 1100 දවල් කාලගුණය වඩා උණුසුම්

පැෂන් ගෙඩිය නැති වෙලා



අදත් මම පැෂන් ගෙඩිය බලන්න ගියා. ඒක වැලේ තිබුණේ නැහැ. මට හරිම දුකයි. මම ඇඩුවා. අම්මට කිව්වා. අම්මා ඇවිත් පැෂන් ගෙඩිය හොයලා දුන්නා. ඒත් ඒක තිබුණේ වැලේ නෙමෙයි. වහලේ උඩ ඒකේ පැත්තක් දුඹුරු පාට වෙලා තිබුණා.මගේ පැෂන් ගෙඩියේ ඉරි තිබුණා.පැත්තක් ඇතුළට එබිලා තිබුණා.මම ඒක ඇතුල දුඹුරු පාටයි. අද මට ගොඩාක් දුකයි.

මගේ වැටුණු පැෂන් ගෙඩිය ප්‍රමාණයේම ගෙඩියක් බලලා මම හෙට ඉදන් විස්තර ලියනවා.

දිනය 2023.07.26 ස්ථානය ගෙවත්ත

කාලය 1100 දවල් කාලගුණය සාමාන්‍ය

<u>පැෂන් ගෙඩිය ටිකක් ලොකු වෙලා</u>



අදත් මම පැෂන් ගෙඩිය බලන්න ගියා. වහලේ උඩ පැෂන් ගෙඩි වැටිලා. ඒ වගේ පැත්තක් සත්තු කාලා. ඒවා කාලා තියෙන්නේ රිලව්. එයාලටත් බඩගිනි හැදෙනවනේ. ඒත් මගේ පැෂන් ගෙඩිය කාල නෑ.

පැෂන්වලට වැල් දොඩම් කියලා නමක් තියෙනවලු. අම්මා කිවුවා.


මගේ වැල් දොඩම් ගෙඩියේ දිග වැඩි වෙලා. මගේ වැල් දොඩම් ගෙඩියේ පාටත් වෙනස් වෙලා.

තද කොළ පාට අඩු වෙලා ලා කොළ පාට වැඩි වෙලා.

පොඩියට තිබුණු සුදු පාට තිත් ලොකු වෙලා.

වැල් දොඩම් ගෙඩිය ලොකු වෙලා

| | | | |
|---|---|---|---|
| දිනය | 2023.07.26 | ස්ථානය | ගෙවත්ත |
| කාලය | 1100 දවල් | කාලගුණය | උණුසුම් |



අද තව ටිකක් වැල්දොඩම් ගෙඩිය ලොකු වෙලා.ඒක හැදිලා තිබෙන වැලේ දල්ල ලා කොළ පාටයි.

ඒ උනාට ඒක සිනිදු නෑ.හරිම ගොරෝසුයි.

මම පැෂන් ගෙඩියේ  දිග මැන්නා. ගිනිකූරු දෙකක දිගක් තිබුණා.

❖ අන්තර්ජාලයෙන් වැල් දොඩම් ගැන මම ඉගෙනගත් දේවල්

සිංහල නම - වැල් දොඩම්

ඉංග්‍රීසි නම - **Passion Fruit**

විද්‍යාත්මක නම - **Passiflora edulisf**

කුලය - පැසිප්ලොරේසියේ

2023.08.22

අද පැෂන් ගෙඩිය වෙනස් වෙලා නෑ

2023.08.24

අදත් රිලව් ආවා.මම මගේ පැෂන් ගෙඩිය පැෂන් කොළ ඇතුලෙ හැංගුවා.රිලව් ඒක කන නිසා.

2023.08.28


අද නම් පැෂන්  ගෙඩියේ පාට වෙනස් වෙලා.ඒකේ ඉස්සරහා දුඹුරු පාට වෙලා.

2023.08.31

අද පැෂන් ගෙඩිය දුඹුරු පාට වෙලා.වෙනදාට වැඩිය ඒකෙ පාට වැඩි වෙලා.

2023.09.02

අද මම මගේ නිරීක්ෂණය අවසන් කරන්න ඕන නිසා පැෂන් ගෙඩිය කැඩුවා.ඒක හොඳටම ඉදිලා නෑ.



මගේ වැලේ තවත ගෙඩවලට මැසසො විදලා තිබුණා. මාමා කිව්වා ඒ මැස්සෝ විදලා නෙමෙයි.වෛරස් රෝගයක් කියලා.වෛරස් රෝග කියන්නේ මොකක්ද කියලා මම දන්නේ නෑ.මාමා කිව්වා ඒ වෛරස් රෝගවලට බෙහෙත් දාන්න ඕන කියලා.වෛරස් රෝග ගැනත් මම සොයන්න හිතුවා.

❖ නිගමනය

පැෂන් ගෙඩි හැදෙන්නේ වැලක

පැෂන් ගෙඩි හැදෙන්නේ මලකින්

❖ ලබා ගත් දැනුම

හැම මලකින්ම ගෙඩි එන්නේ නෑ

හැම ගෙඩියක්ම ලොකු වෙනකන් තියෙන්නේ නෑ.

ගෙඩියක් හැදිලා ඉදෙන්න ටික දවසක් ඉන්න වෙනවා.

❖ ගැටලු හා විසදුම්

සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම.

පැෂන් ගෙඩිය කොළ ඇතුළේ හැංගුවා.

පැෂන් ගෙඩිය නරක්වීම.

වෙනත් පැෂන් ගෙඩියක් බලා නිරීක්ෂණය කිරීම

❖ මගේ අනාගත සැලසුම්

වැල් දොඩම් ගැන තවත් ඉගෙන ගැනීම

තවත් පළතුරු මගේ ගෙවත්තේ සිටුවනවා.

❖ පරිසරය සුරකීමට අපට කල හැකි දේ

ගස් කපන්නේ නැතිව සිටීම

සතුන්ට කෑමට තවත් පළතුරු ගස් සිටුවීම

හැමතැනම පොළිතින් විසි නොකර සිටීම.

❖ මා ලබා ගත් අත්දැකීම්

ගස් ගැන සොයා බලා ලියන විදිහ ඉගෙන ගත්තා.

නිකන් ඉන්න වෙලාවට ගස් ගැන බලන්න පුලුවන් කියලා ඉගෙන ගත්තා.




SPORTS



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගතපරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට ඇවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහි දී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මකබවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිලියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,

සෙනෙවිරත් මහලේකම්